**කැලෑ දෙපාර්තමේන්තු අරමුදල - 2014**

කැලෑ දෙපාර්තමේන්තු අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන කැලෑ ආඥා පනතේ (451 අධිකාරිය) 64 වගන්තිය යටතේ සාදනු ලැබූ රෙගුලාසිවල අංක 10-ඊ දරන නියෝගය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ .මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000-1810)අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර

පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කැලෑ දෙපාර්තමේන්තු අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** වන අපරාධ නඩු අවසන් වී අදාළ දඩ මුදල් අධිකරණ මඟින් අරමුදලට ගෙවනු ලැබ ඇති නමුත් වර්ෂය අවසානයේදී නිලධාරීන්ට ගෙවිය යුතුව තිබෙන ත්‍යාග මුදල් ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ හා වර්ෂය අවසානයේ ලැබිය යුතු දඩ මුදල් නිවැරදිව ගණනය කර ගිණුම්ගත නොකිරීම හා වැරදි සහගත ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ දඩ මුදල් ආදායම රු.667,484 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් වශයෙන් රු. 1,704,102 ක් ඇස්තමේන්තු කර ගිණුමේ පෙන්වා තිබුණද 2015 වර්ෂයේ මුල් මාස 02 තුළදී පමණක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් උසාවි දඩ මුදල් වශයෙන් රු. 2,027,093 ක් අරමුදල වෙත ලැබී තිබුණි. මේ අනුව ලැබිය යුතු මුදල් ඇස්තමේන්තු කිරීම නිවැරදි පදනමකින් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ඈ) වන ජීවී දෙපාර්තමේන්තුවට බැර විය යුතු රු. 178,500 ක අධිකරණ දඩ මුදල් හා අධිකරණ වෙත ආපසු ගෙවිය යුතු රු. 37,500 ක දඩ මුදල් ආදායම් ලෙස හඳුනාගැනීම නිසා අධිකරණ දඩ ලැබීම් රු. 216,000කින් වැඩියෙන් දක්වා තිබූ අතර මෙම මුදල් ආදාළ පාර්ශවයන් වෙත ගෙවීමේදී ත්‍යාග ප්‍රදාන ගිණුම හර කිරීම නිසා වර්ෂයේ ත්‍යාග ප්‍රදාන එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

---------------------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු.19,286,799 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 10,282,541ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 9,004,258 ක වැඩි වීමක් නිරීක්ෂණය විය. අධිකරණ දඩ මුදල් ලැබීම් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු. 7,845,796 කින් වැඩි වීම නිසා සමස්ත ලැබීම් සියයට 28 කින් වැඩි වී තිබූ අතර, තෑගි ප්‍රදාන සමාලෝචිත වර්ෂයේදී රු.1,292,784 කින් අඩු වීම හා පුහුණු වියදම් රු. 565,092 කින් අඩු වීම නිසා සමස්ථ ගෙවීම් සියයට 15 කින් අඩුවී තිබීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) උසාවි මඟින් අයකරගත් මුදල් කැලෑ අරමුදලට බැර කිරීමට ප්‍රමාදවීමක් සිදුවී තිබූ අතර වර්ෂය තුළ එක් එක් මාසය සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් ආදායම් නිවැරදිව ගණනය කිරීම හෝ ඒ සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණි.

(ආ) වන අපරාධ නඩු අවසන්ව ඇතත් එම වන අපරාධ වැලැක්වීම සඳහා දායකවූ නිලධාරීන් විසින් ත්‍යාග මුදල් ඉල්ලුම් කිරීමේ හා ඉල්ලුම් කළ ත්‍යාග මුදල් ලබාදීමේ ප්‍රමාදයන් වැලැක්වීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

2014 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

2014 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

නීතිය ක්‍රියාත්මක කිරීමෙහි යෙදී සිටින නිලධාරීන්ගේ එම කාර්යය අගයමින් ප්‍රතිලාභ ලබාදීම ප්‍රධාන අරමුණින් පිහිටුවා ඇති කැලෑ දෙපාර්තමේන්තු අරමුදලෙන් ලබාදෙන ත්‍යාග ප්‍රදාන වැය පාලනයක් කිරීම තුළින් පාලනය කළ හැකි වියදමක් නොවුවද , සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල සංඛ්‍යාලේඛන අනුව සෑම වර්ෂයකම ඇස්තමේන්තු වියදමින් සියයට 25 – 30 අතර ඉතිරියක් පැවතුණි. ක්‍රමානුකූල වැය පරිපාලනය කිරීම මෙම ඉතිරියට හේතුව ලෙස කළමනාකාරීත්වය දක්වා තිබුණද අඛණ්ඩව සැලකිය යුතු ඉතිරියක් පැවතීම නිසා අය වැය ඇස්තමේන්තු නිවැරදි පදනමක් මත සිදු නොකරන බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වන සංරක්ෂක ජනරාල් වෙත වරින්වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) අයවැය පාලනය

(ආ) ආදායම් එකතු කිරීම් හා බැංකුගත කිරීම

(ඇ) ගිණුම් තැබීම